The Jornal of the Faculty of Humanities (JHU) (2024), Volume 32, Issue 2, 17-41
ISSN 1391-5096 (Print), ISSN 2783 – 8951 (Online)

# පොලොන්නරු යුගයේ සන්නස්වලින් හෙළිවන මධ්‍යතන යුගයේ භාෂා ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක්

ආචාර්ය සුදත් සෙනරත්
පී. ජී. පියුමි සඳමාලි

## Abstract

Polonnaruwa era which belongs to 12th century is counted for medieval age and it is the first age of literature of Sannasa Abayagiriya copper plate Sannasa, wallipuram gold Sannasa can be seen in Anuradhapura era and features Which can be seen in real Sannasa can't been seen in them. so they can't be taken Sannasa history. The word "*Sannasa*" has been primarily used for stone inspections and it obviously shows through pre historical documents. "*Sannasa*"is a document with the state emblem issued by the government. But it is a clear fact that in some "*Sannasa*" could be firstly seen in Polonnaruwa era. It has been used in "*Panakaduwa Thamba Sannasa*" and it belongs to Polonnaruwa era. The other "*Sannasas*" which belong to Polonnaruwa era *Allai*, *Doratiyawe, Bamunagala.* The specific feature in these *Sannasa* is the ability to see the prevalent language characteristics. The prime objective of the research is to discuss the language characteristics in *Sannasa* of medieval age. There are many objectives in this research and some of them are. Making easy access to modern studies filling the gap of Polonnaruwa era Sannasa prevailing language style. Looking into medieval language characteristic taken a prime place. This research is entirely based on primary and secondary sources followed by Qualitative research methods. The last conclusion of this study is the a number of languages

specification followed by medieval language characteristics can be seen in Polonnaruwa "*Sannasa*".

**Key words:** *Bamunagala, Medieval Language, Panakaduwa, Polonnaruwa Era, Sannas*

## හැඳින්වීම

එච්. සී. පී. බෙල් පවසන පරිදි සන්නස යනු රත්තරන්, රිදී, තඹ හෝ තල්පත් වැනි අමුද්‍රව්‍යයක් භාවිත කොට රජු විසින් පමණක් හෝ නිකුත් කරන රාජකීය ප්‍රදානයකි.[1] මේ පිළිබඳ ව දීර්ඝ අධ්‍යයනයක් සිදු කළ ආනන්ද කුමාරස්වාමි පෙන්වා දෙන පරිදි සන්නස වැඩි වශයෙන් ලියනු ලැබුවේ තඹ පත් මත ය. රන්, රිදී පත් කලාතුරකින් මේ සඳහා යොදා ගෙන ඇත. මේවාහි රාජ්‍ය ලාංඡනය අනිවාර්යෙන් යොදා තිබෙන අතර එය 'ශ්‍රී' වශයෙන් මනාව සලකුණු කර ඇත.[2] මීට අමතර ව ආනන්ද තිස්ස කුමාර ද සන්නස යන්න දීර්ඝ වශයෙන් විග්‍රහ කරයි. එනම්,

සංස්කෘත 'හංස+සංඥා' (හංසයාගේ සලකුණ) යන්නෙන් සිංහලයට ප්‍රභින්න වන 'හස්+සන්' යන වචනය පසු ව 'සන්+හස්' යනුවෙන් පෙරළී ක්‍රමයෙන් පැමිණ සන්නස යන්න 'සන්+හස්' යන වදන් පූර්ව රූප සන්ධි ක්‍රමයට සුසැදුණකි. මේ අනුව හංසවාචී 'හස්' යන්න ද සංඥාවාචි 'සන්' යන්න ද සිංහලයට මාතෘ භාෂාවෙන් තත්භව වී රාජකීය ලාඤ්ඡන අර්ථයේ ව්‍යවහාර ප්‍රාප්ත වූ බව පෙනේ. රාජකීය මුද්‍රාවට මේ අවධිය තුළ හංස රූප සහිත සංකේත භාවිත වූ නිසාදෝ මෙය නාමය වඩාත් ප්‍රකට විය. තවද සන්නස් සඳහා පර්යාය පද ලෙස රාජශාසන, රාජපණ්ණ, තාම්‍රශාසන, තාම්බ්‍රශාසන, තඹපත්, තඹපත් සන්නස, තඹ සන්නස[3] ආදී වශයෙන් ව්‍යවහාරයට පත්ව ඇත. ඒ අනුව ගුණසේන ශබ්දකෝෂයෙහි සන්නස් වූ කලී කෙනෙකුට රජයෙන්

1. Bell H. C. P, **Report on the kegalla district archaeological survey of Ceylon. (**Government printer ,1892) 91 P.
2. කුමාරස්වාමි, ආනන්ද, *මධ්‍ය කාලීන සිංහල කලා*. (සංස්කෘතික දෙපාර්තමේන්තුව, 1962) 205 පි.
3. තිස්ස කුමාර, ආනන්ද, *සිංහල සන්නස් හා තුඩපත්*. (කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2006) 12 පි.

වතුපිටි ආදිය ප්‍රදානය කිරීමේ දී දෙන රාජ මුද්‍රාව සහිත ලියවිල්ල[4] බව සඳහන් කරයි. ඉඩම් පවරා දීමේ නීත්‍ය වාර්තා පිළිබඳ අධ්‍යයනයක දී එච්. ඩබ්. කොඩ්රින්ටන් 'තඹ පත්' යන්න සිංහලයෙන් 'සන්නස්' හෝ 'සන්නස' ලෙස ව්‍යවහාර වන බවත් මෙය පදගතාර්ථයෙන් 'අත්සන' සහ 'මුද්‍රාව' වන නමුත් සාමාන්‍යයෙන් ඉන්දියාවෙහි තඹ පුවරුවල දක්නට ඇති මුද්‍රාව ලංකාවේ සම්පූර්ණයෙන් ම අතුරුදහන් වී ඇතැයි පවසන ඔහු කලාතුරකින් දක්නට ලැබෙන පරිදි තඹ පත් කිහිපයක ලියැවුණු ප්‍රදානයක පවා මුද්‍රාව දක්නා නොලැබෙන බව සඳහන් කරමින් සන්නසක අනිවාර්ය වූ මුද්‍රාව පිළිබඳව අවධානය යොමු කරයි.[5]

මෙම නිර්වචනයන්ට අනුකූල ව විමසා බලන කල සන්නස යනු ආයතනයකට විහාරස්ථානයකට හෝ පෞද්ගලික වශයෙන් සිදුකරන ඉඩකඩම්, නිවාස, පොකුණු ධන ධාන්‍ය හෝ වෙනත් භෞතික වස්තු හා තාන්න මාන්න වශයෙන් සිදුකරන තනතුරු ප්‍රදානයන් වශයෙන් පැහැදිලි වෙයි. මධ්‍යයතන යුගයට අයත් මෙකී සන්නස්හි සුවිශේෂතාව වන්නේ ඒවායෙහි මධ්‍යකාලීන භාෂා ලක්ෂණ රැසක් සංගෘහිත වන හෙයිනි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ප්‍රධාන වශයෙන් භාවිත කරන්නේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය (Qualitative Methed) යි. මේ සඳහා දත්ත රැස් කරන ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ ක්ෂේත්‍ර අධ්‍යයනය යි. එහි දී පොළොන්නරු යුගයට අයත් කාලසීමාවේ රචිත සන්නස් පිළිබඳ අවධානය යොමු කිරීමට අපේක්ෂිත ය. ද්විතය මූලාශ්‍රය ලෙස ග්‍රන්ථ හා පර්යේෂණාත්මක ලිපි ලේඛන පරිශීලනය සිදු කෙරෙයි. දත්ත විශ්ලේෂණය කිරීමේ දී කෘත්‍යවාධි ප්‍රවේශයකින් යුක්ත ව අදාළ නිගමනවලට එළඹීමට ප්‍රයත්න දැරිණි.

4. හරිශ්චන්ද්‍ර, විජයතුංග, *ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය.* (කොළඹ 11: ගුණසේන සහ සහෝදරයෝ, 2017) 176 පි.
5. කොඩ්රින්ටන් එස්. ඩබ්ලිව්, *ලංකාවේ පුරාතන ඉඩම් භුක්තිය හා ආදායම,* (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1980) 40 පි.

## සාහිත්‍ය විමර්ශනය

ශ්‍රී ලාංකේය සන්නස් සාහිත්‍යයෙහි ප්‍රථම යුගය වන පොළොන්නරු යුගයේ සන්නස් පිළිබඳ අධ්‍යයනයන් සිදු කළ පර්යේෂකයන් ඉතාමත් දුර්ලභ ය. එමෙන් ම තත් සන්නස්වලින් පිළිබිඹු වන මධ්‍යකාලීන භාෂා ලක්ෂණ පිළිබඳ ව තොරතුරු ද ඉතාමත් විරල ය; නොමැති තරම් ය. ඒ අනුව පර්යේෂණට අදාළ සාහිත්‍ය විමර්ශනය සහ පර්යේෂණ රික්තය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී සන්නස් පිළිබඳ ව තොරතුරු සංගෘහීත ප්‍රධාන කෘතිය වන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයෙහි මහාචාර්යවරයකු වන ආනන්ද තිස්ස කුමාරගේ *සිංහල සන්නස් හා තුඩපත්* (2006) යන කෘතිය යි. මෙම කෘතියෙහි සිංහල සන්නසෙහි ක්‍රම විකාසනය, ප්‍රදානය සහ ආකෘතිය, දායක ප්‍රතිග්‍රාහක තොරතුරු, සන්නස් ප්‍රදානවලින් හෙළිවන දේශපාලන හා පරිපාලන සංස්ථා යනාදී සන්නස පිළිබඳ තොරතුරු සංක්ෂිප්තව දක්වා ඇත. එම කෘතියෙහි පොළොන්නරු යුගයට අයත් ජනප්‍රිය සන්නස් පමණක් නාම මාත්‍රිකව පෙන්වා දුන්න ද පොළොන්නරු යුගයේ සන්නස් පිළිබඳ ව හෝ භාෂාව පිළිබඳ ව හෝ අවධානයක් යොමු කර නොමැත.

මීට අමතර ව පොළොන්නරු යුගයේ ප්‍රථම සන්නසක් වන පනාකඩුව සන්නස පිළිබඳ ව **Epigraphia Zeylanica** Vol. V (1-25 P) දක්වා ඇත. පී.ඊ.ඊ. ප්‍රනාන්දු මහතා අල්ලයි සන්නස පිළිබඳ **The Sri Lanka Journal of the Humanities** (1978) සඟරාවෙහි කරුණු හෙළි කර ඇත. Codrington H.W. and D.P.D. Mirihelle යන දෙදෙනා **Journal Of The Ceylon Branch Of The Royal Asiatic Society** (Vol. XXIX, 1925) යන සඟරාවෙහි දොරටියා සන්නස පිළිබඳ තොරතුරු දක්වා ඇත. මීට අමතර ව ජී.එස්. රණවැල්ල මහතාගේ **Inscription of Ceylon** (2007) සඟරාවෙහි Vol. VI හි පනාකඩුව තඹ සන්නස, අල්ලයි සන්නස සහ දොරටියාව සන්නස පිළිබඳ තොරතුරු අන්තර්ගත වෙයි. මීට අමතර ව කොත්මලේ අමරවංශ හිමියන්ගේ *ලක්දිව සෙල්ලිපි* (2014) නම් කෘතියෙහි පනාකඩුව තඹ සන්නස පිළිබඳ ව තොරතුරු අන්තර්ගත වෙයි. මැන්දිස් රෝහණදීර *බද්දේගම ගිං ගඟේ කිඹුල් මන්ත්‍රය සමග සුවිශේෂ ඓතිහාසික ලේඛන හතක්* (2011) යන කෘතියෙහි බමුණාගල සන්නස ප්‍රමුඛ අල්ලයි සන්නස, දොරටියාව සන්නස පිළිබඳ විවරණය කරයි. දේව මයිකල් ද සිල්වාගේ *පනාකඩුව තඹ සන්නස* යන කෘතියෙහි

(2003) පනාකඩුව තඹ සන්නසෙහි ශෛලිය සම්බන්ධ තොරතුරු සහ අතීත ලංකාවේ අධිකරණ විධික්‍රමය පිළිබඳ ව තොරතුරු අඩංගු වෙයි. එහෙත් මෙම කෘතියෙහි එකී විග්‍රහය පනාකඩුව තඹ සන්නසෙහි භාෂාව පිළිබඳ ව ප්‍රමාණවත් තොරතුරු රැගත් කෘතියක් නොවන බව කිව යුතු ය. ඒ අනුව පොළොන්නරු යුගයේ සන්නස් භාෂාව පිළිබඳ ව යම් කිසි රික්තයක් ඇති බව ද පැහැදිලි ය.

## සාකච්ඡාව සහ නිගමනය

පොළොන්නරු යුගයේ සන්නස්වල අන්තර්ගත මධ්‍යතන යුගයේ භාෂා ලක්‍ෂණ පිළිබඳ ව විවරණය කිරීමට ප්‍රථමයෙන් මධ්‍යතන යුගය පිළිබද තොරතුරු අධ්‍යයනය කළ යුතු ය. සිංහල භාෂාව වනාහි ධනවත් වූත්, වර්ණවත් වූත්, ඓතිහාසික දූරාතීතයකට හිමිකම් කියන්නා වූත් ගතික භාෂාවකි. මෙහි ආරම්භක අවධිය 19 වන සියවසේ ප්‍රථම භාගය දක්වා දිව යයි. ඒ අනුව එකල ජීවත් වූ යුරෝපීය පඬිවරුන් සිංහල භාෂාවේ සම්භවය පිළිබඳ ව විමසීමටත්, පරීක්‍ෂණ සිදු කිරීමටත්, සොයාගත් තොරතුරු විවාදයට බඳුන් කරමින් ඇතැම් නිගමනවලට එළඹීමටත් සමත් විය. තුලනාත්මක හා ඓතිහාසික වාග් විද්‍යාවෙහි වාග් විද්‍යාත්මක ක්‍රම උපයෝගී කොටගෙන භාෂා පර්යේෂණයෙහි යෙදුණු විල්හෙල්ම් ගයිගර් වැනි පඬිවරුන්ගේ කෘතී මගින් එය තටදුරටත් තහවුරු වෙයි. භාෂාවෙහි පරිණාමය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කළ දෙස් විදෙස් වාග් වේදීන්ගේ සාමාන්‍ය දෘෂ්ටියට හසු නොවන්නා වූ කඩතුරාවන්ගෙන් වැසී අපවත් වූ තත් භාෂාත්මක සංසිද්ධීන් පසෙක දමා පරිණාමීය යුග බෙදීම් සිදු කර ඇත්තේ ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසින් මෙපිට කාලයේ දී ය. එම යුග බෙදීම් අතර බහුතරයකගේ සම්භාවනාවට පාත්‍ර වූයේ විල්හෙල්ම් ගයිගර් පඬිතුමාගේ යුග බෙදීම් ය.

ක්‍රි. ව. 1939 දී විල්හෙල්ම් ගයිගර් පඬිතුමා රාජකීය ආසියාතික සඟරාවට සිංහලයේ වාග් විද්‍යාත්මක ලක්ෂණ මැයෙන් ලියූ ලිපියෙහි තත් යුග බෙදීම තවදුරටත් සංශෝධනය කොට ඇත. *සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය* නම් ග්‍රන්ථයෙහි විමල් ජී. බලගල්ලේ එම යුග බෙදීමේ න්‍යාය මෙසේ උපුටා දක්වයි,

- සිංහල ප්‍රාකෘත යුගය - ක්‍රි. පු. 3/2 සියවස සිට ක්‍රි. ව. 4/5 සියවස දක්වා.
- පුරාතන සිංහල යුගය - ක්‍රි. ව 4/5 සියවසෙහි සිට ක්‍රි. ව. 08 සියවස දක්වා.
- මධ්‍යතන සිංහල යුගය - ක්‍රි. ව. 08 සියවස සිට ක්‍රි. ව. 13 සියවස දක්වා.
- සම්භාව්‍ය සාහිත්‍ය යුගය - ක්‍රි. ව. 13 සියවසේ මැද සිට ක්‍රි. ව. 17 වන සියවස දක්වා.
- නූතන සිංහල යුගය - ක්‍රි. ව. 17 වන සියවසේ සිට අද දක්වා.[6]

ඒ අනුව මධ්‍යතන සිංහල යුගය ලෙස වර්ෂ 8 වන සියවසේ සිට 13 ශත වර්ෂයේ මැද භාගය දක්වා අතර කාලය හඳුන්වා දිය හැකි ය. සිංහල භාෂා පරිණාමයෙහි තෙවන යුගය ලෙස සැලකෙන මධ්‍යතන සිංහල අවධිය අනුරාධපුරයෙහි අවසාන භාගයේ සිට පොළොන්නරු යුගය හා දඹදෙණි අවධියෙහි මුල් භාගයත් යන යුගත්‍රය හා සම්බන්ධ වන ලෙස කාල නිර්ණය කරයි. මධ්‍යතන යුගය වනාහි සිංහල භාෂාවේ විශේෂ සංධිස්ථානයක් සනිටුහන් කරන්නා වූ යුගයකි. සිංහල ගද්‍ය භාෂාව වර්තමාන ස්වරූපයට පත් වීමේ මූලාරම්භය ප්‍රථම වරට ප්‍රකට වූයේ ක්‍රි. ව. 8 වන සියවසින් පසු ඇරඹෙන මෙකී මධ්‍යතන යුගය තුළ ය. එ මෙන් ම සිංහල භාෂාවේ කැපී පෙනෙන භාෂා ලක්ෂණ රැසක් ම මෙම යුගයේ දී හමුවෙයි. ප්‍රාකෘත සිංහල යුගයේ සහ පුරාතන සිංහල යුගයන් හි භාෂා සංස්පර්ශයෙහි ප්‍රතිඵලයක් ලෙස පාලි භාෂාව ප්‍රමුඛ කොට ගත්ත ද මධ්‍යතන සමයෙහි සංස්කෘත භාෂාව මුල් විය. එහෙත් පොළොන්නරු යුගයේ මුල් කාලීන සන්නස්හි පාලි භාෂාව ප්‍රමුඛ කරගත් වාක්‍යයන් හමුවීම විශේෂ ය.

ඒ අනුව පොළොන්නරු යුගයේ සන්නස්වලින් විද්‍යමාන වන්නා වූ භාෂා විශේෂතා පහත පරිදි වෙයි.

6. බලගල්ලේ, විමල් ජී., *සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය.* (කොළඹ 10: ගොඩගේ සහ සහෝදරයෝ, 1992). 38 පි., **Journal of the Ceylon Branch of the Royal Asiatic Society**, (Colombo; The Colombo A pothecabies Company, Ltd Printers, Vol XXIX, No 77, part I, II, III, IV,1925.) 90 P.

## 1. 'ඇ' ස්වරයෙහි ආගමනය

'ඇ' කාරය වනාහි සිංහල භාෂාවට ම අනන්‍ය වූ අක්‍ෂරයකි. 'ඇ' කාරය සංස්කෘත, පාලි භාෂාවන්ගේ ද ද්‍රවිඩ භාෂාවෙහි ද අන්තර්ගත නොවන වංගාදී භාෂාවන්ගේ ද දක්නට නොමැති අක්‍ෂරයකි.[7] ඒ අනුව 'ඇ' කාරය යනු සිංහල භාෂාවට ම අනන්‍ය වූ අක්‍ෂරයකි. එය මධ්‍යතන යුගයෙහි ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ සෙයක් තත් කාලීන මූලාශ්‍රය තුළින් ගම්‍යමාන වෙයි. මෙය ප්‍රාකෘත යුගයෙහි සහ පුරාතන යුගයේ දක්නට නොවූ අතර ප්‍රථම වරට ගැරඬිගල සෙල්ලිපියෙහි දැකගත හැකි ය.

මෙ(ලෙ)නෙ (සෙනසන) බැඳැ දෙව// සිද්ධම්[8]

ක්‍රි. ව. 8 වන සියවසෙහි පැවැති සිංහල භාෂාවේ ස්වරූපය හඳුනා ගත හැකි ගැරඬිගල ශිලා ලේඛනය මධ්‍යතන සිංහල යුගයේ ආරම්භක අවධියෙහි සිංහල භාෂාව හඳුනා ගැනීම සඳහා ඇති එක ම නිදසුන වෙයි. පශ්චාත් කාලීන ව නිර්මාණය වුණු පොළොන්නරු යුගයේ සන්නස්වල ද 'ඇ' ස්වරයෙහි ආගමනය දැකගත හැකි වන්නේ මෙ ලෙස ය.

කැත්[9] - ක්‍ෂත්‍රිය > ඛත්තිය > <u>කැත (කැත්)</u>

පනාකඩුව තඹ සන්නසෙහි 'කැරැ, ගල්වලැ, රැකැ, වැළැහි, වනැ, අවධියැ, ගතැ, දැකැ, වරදෙකැ...'[10] ආදි වශයෙන් ද, අල්ලයි හා දොරටියා සන්නස්හි 'තුන්දා ගෙදොරැ, පමුණු කොටැ, හිමැ මෙසේ මැ, යම්මැ, නැගෙනහිරැ, ශ්‍රී මහාපාය කැරැ වූ, ඇමැතැනැමැ'[11] බමුණාගල සන්නසෙහි 'වැඩැ, සොළී රටැ, සිවුරගැ, අල්වා බැදැ, පැහැදැ, වැඩැ, කැඩිපනැ, කිත්තම් පව්වෙන් බිජුවට යාළ හා මෙමැරටැ ආවු බො ගොඩැ කැඩිපනැ බද පැන්මිත වැ'[12] ආදී වශයෙන් 'ඇ' කාරයෙහි ආගමනය දැක ගත හැකි ය.

7. ගයිගර්, විල්හැම්, *සිංහල භාෂාවේ ව්‍යාකරණය.* (ලංකාණ්ඩු මුද්‍රණාලය, 1938) 19 පි.
8. මුදියන්සේ, නන්දසේන, *ශිලා ලේඛන සංග්‍රහය.* 241 පි.
9. අමරවංශ හිමි, කොත්මලේ, *ලක්දිව සෙල්ලිපි.* (කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ 1969). 343 පි. Ranawella, G. S, **Inscription of Ceylon**. 145-155 P. රෝහණදීර, මැන්දිස්, *බද්දේගම ගිං ගගේ කිඹුල් මන්ත්‍රය සමග සුවිශේෂ ඓතිහාසික ලේඛන හතක්.* (PGIAR ප්‍රකාශනයකි, 2011), 59 පි.
10. අමරවංශ හිමි, කොත්මලේ, *ලක්දිව සෙල්ලිපි.* 343, 344, 345 පි.
11. Ranawella, G. S, **Inscription of Ceylon**. 145-155 P.
12. රෝහණදීර, මැන්දිස්, *බද්දේගම ගිං ගගේ කිඹුල් මන්ත්‍රය සමග සුවිශේෂ ඓතිහාසික ලේඛන හතක්.* 58, 60 පි.

මීට අමතර ව අවධානාර්ථයේ 'ම' නිපාතය සඳහා සන්නස්හි 'මෙ හා මැ' යන්න රූපද්වයක් දක්නට ලැබීම ද විශේෂිත ය. නිදසුන් ලෙස "කරනු කොට මෙ වැවස්ථා[13] , ඔවුන් මැ සමඟ වැ[14] , යම් මැ"[15] යන පද හඳුන්වා දිය හැකි ය.

එ සේ ම අටවැනි සියවසට මෙපිට කාලයට අයත් 'ඇ' කාර යෝගය 10 වැනි සියවස වන විට 'පෙරැ, කැරැ, රැකැ, ගතැ, දැකැ, වැඩැ, ඇදී' ලෙස පූර්ව ක්‍රියා විෂයෙහි හා ආධාර විභක්ත්‍යර්ථ විෂයෙහි ද අනම්‍යාදේශය උදෙසා ද බහුල ව භාවිතයට පැමිණ තිබූ බව සන්නස්වලින් පැහැදිලි වෙයි. එ මෙන් ම ස්ථාන නාම හැඳින්වීම සඳහා මෙන් ම නාම පද, ක්‍රියා පදය සඳහා ද අඩු වැඩි වශයෙන් භාෂාවෙහි 'ඇ'කාරය භාවිත කර ඇති බව පොළොන්නරු සන්නස්වලින් විද්‍යමාන ය.

**2. මෙතෙක් සිංහල ලේඛනයෙහි හමු නො වූ අනුස්වාරය, වර්ගාන්ත අනුනාසික සංයුක්ත ව්‍යඤ්ජන කීපයක් හා සඤ්ඤක අක්ෂර පළමුවරට දක්නට ලැබීම**

මෙම යුගයෙහි ඇතැම් වචන උච්චාරණය කිරීමේ දී අනුනාසික ස්වභාවයක් ගනු ලැබුව ද මුල් කාලයෙහි ඒ සඳහා ස්ථිර ලිඛිත සංකේතයක් නො වී ය. පසු ව එකී සුවිශේෂතා භාෂාවට එක් වූ බව පහත දැක්වෙන නිදසුන්වලින් පැහැදිලි වෙයි.

දඹදිව[16] - ජම්බුද්වීප > ජම්බුදීප > දම්බ්දිව් > දඹදිව.

සිරිසඟබෝ[17] - සිරි සඞසබෝධි > සිරි සගබො > සිරි සඟ්බෝ > සිරි සඟබෝ

13. අමරවංශ හිමි, කොත්මලේ, *ලක්දිව සෙල්ලිපි.* 344 පි.
14. රෝහණදීර, මැන්දිස්, *බද්දේගම ගිං ගගේ කිඹුල් මන්ත්‍රය සමග සුවිශේෂ ඓතිහාසික ලේඛන හතක්.* 59 පි.
15. Ranawella, G. S, **Inscription of Ceylon**. 140 P.
16. අමරවංශ හිමි, කොත්මලේ, *ලක්දිව සෙල්ලිපි.* 341 පි. Ranawella, G. S, **Inscription of Ceylon**. 150,155 P. රෝහණදීර, මැන්දිස්, *බද්දේගම ගිං ගගේ කිඹුල් මන්ත්‍රය සමග සුවිශේෂ ඓතිහාසික ලේඛන හතක්.* 59 පි.
17. අමරවංශ හිමි, කොත්මලේ, *ලක්දිව සෙල්ලිපි.* 341 පි.

බැඳ[18] - බන්දිත්‍වා > බැන්දැ > <u>බැඳ</u>

උක්ත උදාහරණ අනුව අර්ධානුනාසික්‍ය හා පූර්ණානුසික්‍ය අක්ෂරයන්හි භාවිතය පිළිබඳව එකඟතාවක් නොවූ බව පැහැදිලි ය. අර්ධ අනුනාසික්‍ය භාවිතය පිළිබඳ *සිංහල ගද්‍ය භාෂාවේ විකාසනය* කෘතියෙහි මෙසේ දක්වයි. දම්බිදිව්, හින්ද්වා, කුම්බුර් යනාදි පූර්ණ අනුනාසික භාවිතය ද ඉතා ප්‍රකට ය. 'සංබෝ' යන තැන පූර්ණ අනුනාසික අනුස්වාරය යෙදීම ද වැදගත් වූ භාෂා ලක්‍ෂණයකි."[19] ඒ අනුව නිශ්ශංකමල්ල රජුගේ අල්ලයි තඹ සන්නසෙහි 'කලිඟ, මඬපය, තාම්‍රශාසන'[20] යන්නත්, චෝඩ ගංග රජුගේ බමුණාගල තඹ සන්නසෙහි 'ගඟ, වසඟ, ලංකාව, සංහිඳුවා, ටැඹ, කුඹුරේ,[21] ආදී වශයෙන් සඳහන් වෙයි. මීට අමතර ව 'අඳුර', 'සඳ'[22] වැනි වචන හමුවීම ද විශේෂ ය. ඒ අනුව සන්නස්වලින් විද්‍යමාන වන්නා වූ අනුස්වාරය, වර්ගාන්ත අනුනාසික ව්‍යඤ්ජන හා සංයුක්ත ව්‍යඤ්ජන කිහිපයක් ද, සඤ්ඤක අක්‍ෂර සහිත මධ්‍යතන යුගයේ පරිණාමීය ලක්‍ෂණ පොළොන්නරු යුගයේ සන්නස්වල සංගෘහීත වන අන්දම මෙලෙස පෙන්වා දිය හැකි ය.

## 3. ද්විතීය දීර්ඝ ස්වරයේ පහළවීම හා ලේඛනයෙහි ස්වරයන්ගේ හ්‍රස්ව දීර්ඝතා නිරූපණය

ද්විතීය දීර්ඝ ස්වරයේ පහළවීම හා ලේඛනයෙහි ස්වරයන්ගේ හ්‍රස්ව දීර්ඝතා නිරූපණය මධ්‍යතන කාලයට අයත් ලක්‍ෂණයක් වන අතර එය ජාතක අටුවා ගැට පදය, ධම්පියා අවටුවා ගැට පදය ආදී කෘතීන් තුළ සඳහන් වන ජාතක > ජා, ආගත > ආ, නාග > නා, පාද > පා වැනි වචන වචනවලින් පැහැදිලි වෙයි. නමුත් මෙම ලක්ෂණය පොළොන්නරු යුගයේ සන්නස් තුළ අන්තර්ගත වන්නේ මඳ වශයෙන් ය.

---

18. රෝහණදීර, මැන්දිස්, *බද්දේගම ගිං ගගේ කිඹුල් මන්ත්‍රය සමග සුවිශේෂ ඓතිහාසික ලේඛන හතක්.* 59 පි.
19. මල්ලවආරච්චි, නිමල්, *සිංහල ගද්‍ය භාෂාවේ විකාශනය.* (කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ 2005) 45 පි.
20. Ranawella, G. S, **Inscription of Ceylon**. 150 P. hi 87
21. රෝහණදීර, මැන්දිස්, *බද්දේගම ගිං ගගේ කිඹුල් මන්ත්‍රය සමග සුවිශේෂ ඓතිහාසික ලේඛන හතක්.* 59, 60 පි.
22. අමරවංශ හිමි, කොත්මලේ, *ලක්දිව සෙල්ලිපි.* 341, 342 පි.

පනාකඩුව සන්නසෙහි ඈපා[23] යන වචනය ද, අල්ලයි, දොරටියා සන්නස්හි 'පැලැකුළු'[24] යන වචනය ද, බමුණාගල සන්නසෙහි දැක්වෙන 'වැ සර'[25] ආදි වචන තුළින් ද දීර්ඝ ස්වර නිරූපණය පැහැදිලි වෙයි. ඒ අනුව සිදත් සඟරාවෙහි දීර්ඝ අක්ෂර පිළිබඳ ව ප්‍රථමයෙන් ම සඳහන් වුව ද, දීර්ඝ ස්වර භාවිතය සිදත් සඟරාවට පෙර සිට ම ස්ථාවර වෙමින් පැවැති බව පොළොන්නරු යුගයේ සන්නස්වලින් විද්‍යමාන වෙයි.

## 4. සරඅත් හලත් වෙසෙස පහළ වීම

වචනයක ස්වරිත නොවූ පදාන්ත ස්වරය ඇතැම් පරිසරයක දී ලොප්වීම හේතු කොටගෙන හලන්ත වචන බිහිවීම කරණකොට ගෙන මෙතෙක් සිංහලයේ නොපැවැති සරඅත් හලත් හෙවත් හල් අක්ෂර භාවිතය පහළ විය. මෙය ද ප්‍රබල මධ්‍යකාලීන භාෂා ලක්ෂණයක් වන අතර භාෂාවේ මෙම විශේෂත්වය පොළොන්නරු යුගයේ සන්නස්වල මනාව වූ සංගෘහිත වෙයි.

ඒ අනුව පනාකඩුව තඹ සන්නස, අල්ලයි තඹ සන්නස, දොරටියාව සන්නස, ආදී සන්නස් සියල්ලෙහි ම ආරම්භක ප්‍රශස්තිය නිර්මාණය වී ඇත්තේ හලන්ත බාහුල්‍යයකින් වීම විශේෂ ලක්ෂණයකි. "සිරිවත් අපිරියත් ලෙහිකුත් ගුණ මුළිනුතුරත් මුළු දම්බදිවුහි අන් කැත්කුල පාමිලි කළ ඔකාවස් රජ පරපුරෙන්...."[26]

මෙකී හලන්ත බාහුල්‍යකින් යුත් රාජ ප්‍රශස්තිය අඹගමුව සෙල්ලිපිය ඇතුළු තවත් බොහෝ අභිලේඛනයන්හි ද දැකගත හැකි ය. මීට අමතර ව 'රක්මින් මුළු ලොය්න් පුස් මින් මුළු ලොය් පුසැ වැඩිතැන්...' ආදී වශයෙන් පනාකඩුව සන්නස පුරා ම පාහේ මෙම ලක්ෂණය දැකගත හැකි අතර බමුණාගල තඹ සන්නසෙහි 'පො(දෙ)ල් පුවක් උක් රැබ් අරබ් රජ්කොල් කැමියන් නොවද්නාක්...' ආදී වශයෙන් ද එකී ලක්ෂණය දැක්වෙයි.

---

23. එම. Ranawella, G. S, **Inscription of Ceylon**. 150, 155 P.
24. Ranawella, G. S, **Inscription of Ceylon**. 150, 155 P.
25. රෝහණදීර, මැන්දිස්, *බද්දේගම ගිං ගගේ කිඹුල් මන්ත්‍රය සමග සුවිශේෂ ඓතිහාසික ලේඛන හතක්.* 60 පි.
26. අමරවංශ හිමි, කොත්මලේ, *ලක්දිව සෙල්ලිපි.* 341, පි. Ranawella, G. S, **Inscription of Ceylon**. 149, 155 P. රෝහණදීර, මැන්දිස්, *බද්දේගම ගිං ගගේ කිඹුල් මන්ත්‍රය සමග සුවිශේෂ ඓතිහාසික ලේඛන හතක්.* 58 පි.

## 5. මූලික ශබ්ද පද්ධතියෙන් 'ච' කාරය ඉවත්ව යාම

අක්‍ෂර පද්ධතියෙහි 'ච' කාරය වනාහි විශේෂත්වයකින් යුක්ත අක්‍ෂරයකි. සිදත් සඟරා අක්‍ෂර මාලාවෙහි මෙම අක්‍ෂරය දැක ගත නො හැකි ය. එයට හේතු ප්‍රත්‍ය විමසා බැලීමේ දී එය මධ්‍යතන යුගය දක්වා දිව යයි. ඒ අනුව පුරාණ ඉන්දීය ආර්ය ආදි 'ච' කාරය සහ 'ච්ච/ ච්ඡ' සංයෝගය පළමුව 'ස' බවට හා දෙවනු ව 'හ' බවටත් ස්වර මධ්‍යගත කේවල 'ච' කාරය පූර්ව යුගයේ දී පළමු ව 'ජ' බවටත් දෙවනු ව 'ද' බවටත් පත්වීම නිසා සිංහලයේ මූලික ශබ්ද පද්ධතියෙන් 'ච' කාරය ඉවත් වී යාම සිදුවිය. මෙම භාෂා ලක්‍ෂණය පනාකඩුව, අල්ලයි ආදී සන්නස්වල සංගෘහිත වන්නේ මෙලෙස ය.

සඳ[27] - චන්‍ද්‍ර > *චන්ද /චද > <u>සඳ</u>*

සත්[28] - ඡත්‍ර > *චත > <u>සත්</u>*

මෙපරිද්දෙන් මූලික ශබ්ද පද්ධතියෙන් 'ච' කාරය ඉවත්වීම සම්බන්ධ ලක්‍ෂණයන් ද පොළොන්නරු යුගයේ සන්නස් තුළ දැකගත හැකි ය.

## 6. මහප්‍රාණ අක්‍ෂර භාවිතය

මහප්‍රාණ අක්‍ෂර භාවිතය පොළොන්නරු යුගයේ සන්නස් තුළ ඇත්තේ මඳ වශයෙන් වීම විශේෂ ලක්‍ෂණයකි. නිදසුන් ලෙස ප්‍රමුඛ,[29] ධාතු[30] වැනි අක්‍ෂර සහිත වචන හඳුන්වා දිය හැකි ය.

මීට පෙර යුගයන්හි දක්නට ලැබෙන සෙල්ලිපිවල පවා බොහෝ සෙයින් භාවිත වූයේ 'නගර-වුදික බරණිගුතහ ලෙණෙ...'[31] ආදී වශයෙන් අල්පප්‍රාණ අක්‍ෂර ය. ඒ අනුව මහප්‍රාණ අක්‍ෂර මඳ වශයෙන් භාවිත වූ ආකාරය පොළොන්නරු යුගයේ සන්නස්වල දැකගත හැකි ය.

---

27. රෝහණදීර, මැන්දිස්, *බද්දේගම ගිං ගගේ කිඹුල් මන්ත්‍රය සමග සුවිශේෂ ඓතිහාසික ලේඛන හතක්.* 60 පි.
28. අමරවංශ හිමි, කොත්මලේ, *ලක්දිව සෙල්ලිපි.* 342, පි.
29. අමරවංශ හිමි, කොත්මලේ, *ලක්දිව සෙල්ලිපි.* 342, පි.
30. Ibid. රෝහණදීර, මැන්දිස්, *බද්දේගම ගිං ගගේ කිඹුල් මන්ත්‍රය සමග සුවිශේෂ ඓතිහාසික ලේඛන හතක්.* 60 පි.
31. I. C. Vol I, No 850.

## 7. මිශ්‍ර සිංහලයෙහි ආරම්භය හා සංස්කෘත භාෂාවෙහි දැඩි බලපෑම

ප්‍රාකෘත හා පුරාතන සිංහල යුගයන්හි මාගධී හෙවත් පාලි භාෂාව මුල් කර ගනිමින් ලේඛනය සිදු වුව ද සංස්කෘත භාෂාවෙහි ප්‍රභාව පාලි භාෂාවට වඩා ඉස්මතු වීම මධ්‍යතන යුගයෙහි දැකගත හැකි ප්‍රබල භාෂා විශේෂතාවකි. මෙකී ලක්‍ෂණය හේතු කොටගෙන මිශ්‍ර සිංහල භාෂාව නිර්මාණය වීම දැක ගත හැකි අතර, මිශ්‍ර සිංහලය ප්‍රධාන ගද්‍ය භාෂාව ලෙස ද ස්ථාපිත විය. එ සේ ම එතුළින් සංස්කෘත සන්ධි, සමාස ආදි ව්‍යාකරණ ප්‍රයෝගයන්ගෙන් ඔප්නංවන පණ්ඩිත ප්‍රිය විදග්ධ භාෂා ශෛලියක් උපයුක්ත වීම ද වැදගත් ය. මෙකී ශෛලිය සාහිත්‍යකරණය සඳහා පමණක් නොව සන්නස්, කතිකාවත්, ව්‍යවස්ථා ආදි අභිලේඛන සඳහා ද යොදාගනු ලැබී ය.[32] සංස්කෘත භාෂාව පොළොන්නරු අවධියේ දී ආකස්මිකව පහළ වුවක් නොවන අතර එය භාෂා හා සංස්කෘතික සංස්පර්ෂ ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් ලෙස මෙරට ස්ථාපිත වූවකි. මෙකී භාෂාව ස්ථාපිත වීම සඳහා සමාජ සාධක රැසක් බලපෑ අතර චෝළ ආක්‍රමණයන්ගේ ප්‍රතිඵලයක් ලෙස හින්දු සංස්කෘතිය ක්‍රමයෙන් සමාජගත වීම ප්‍රමුඛ ලක්‍ෂණයකි. හින්දු සංස්කෘතිය සමාජගත වීමත් සමග ඔවුන්ගේ ආගමික මූලාශ්‍රය රචනා කරන ලද සංස්කෘත භාෂාවට ප්‍රමුඛ ස්ථානයක් ලැබිණ. මීට අමතර ව මහායාන ධර්මයෙහි ව්‍යාප්තියත් සමග මහායානිකයන්ගේ ප්‍රධාන භාෂාව සංස්කෘත වීම ද, එම භාෂාව පණ්ඩිත භාෂාවක් වීම ද, මධ්‍යතන යුගයේ පාලි භාෂාව යටපත් වී සංස්කෘත භාෂාව ඉස්මතු වීම සඳහා බලපෑ ප්‍රධාන සාධක වෙයි. එ මෙන් ම මෙකල සංස්කෘත භාෂාව ව්‍යාප්තව පැවැති බව කුච්චවේලි, තිරියාය, ජේතවනාරාම ආදි සංස්කෘත සෙල්ලිපිවලින් ද, බුද්ධදාස ක්‍රි. ව. (341-370) රජු විසින් රචනා කරන ලදැයි සැලකෙන 'සාරාර්ථ සංග්‍රහය' නම් වෛද්‍ය ග්‍රන්ථයෙන් ද, කුමාරදාස ක්‍රි. ව. (515-524) රජුගේ නිර්මාණ කාර්යයන් තුළින් ද එය පැහැදිලි වෙයි. එලෙස විකාසනය වුණු සංස්කෘත භාෂාවෙහි උච්චතම අවස්ථාව පොළොන්නරු යුගයෙහි දැක ගත හැකි ය.

එය කෙසේ ද යත්: 10 සියවසෙහි පස්වන කාශ්‍යප රජුගේ 'අනුරාධපුර පුවරු ලිපිය' සහ මහා පරාක්‍රමබාහු රජුගේ දොළොස්වන ශතවර්ෂයට අයත් 'ගල්විහාර කතිකාවත' සසඳා බලන විට මෙකී භාෂා විපර්යාසයේ පරස්පරතාව මනාව විශද වෙයි.

---

32. මල්ලවආරච්චි, නිමල්, *සිංහල ගද්‍ය භාෂාවේ විකාශනය.* 77 පි.

මඟුල් සිහසුන් රක් ගල් තල අරය් වජන් බෙරසීනය්නෙන්...[33]

මහා සම්මත පරම්පරානුයාත සුයර්‍ය්‍යවංශෝද්භූත රාජාධිරාජ නෛකදිගභිව්‍යාප්ත..[34]

තව ද පොළොන්නරු යුගයේ සන්නස්හි ශුද්ධ සංස්කෘත පද දක්නට ලැබෙන්නේ මඳ වශයෙන් බව පහත නිදසුන්වලින් පැහැදිලි වෙයි.

ස්වස්ති සිරි[35]
ශ්‍රී, චක්‍රවර්ත්ති[36]

කෙසේ නමුත් පොළොන්නරු යුගයෙහි සන්නස් පුරා ම පාහේ මිශ්‍ර සිංහලය දැකිය හැකි අතර චතුර්විධ සන්නස්හි පූර්වකාලීන සිංහලයෙහි දක්නට ලැබුණු අව්‍යක්ත ලක්‍ෂණ හා කැඩුණු බිඳුණු ස්වභාව නැති වී සිංහලය ඔපමට්ටම් වීමේ ප්‍රාථමික ලක්‍ෂණයන් දැකගත හැකි ය. එහෙත් පොළොන්නරු යුගයේ සන්නස්හි රාජ ප්‍රශස්තිය පිළිබඳ ව විමසා බලන කල ඉන් පුරාතන සම්ප්‍රදායට අනුගත වීමක් ද විද්‍යමාන වෙයි. එයට නිදසුනක් පහත දැක්වෙයි.

"සිරිවත් අපිරියත් ලෙහිකුත් ගුණ මුළිනුතුරත් මුළු දම්බදිවු තෙලෙහි අන් කැත් කුල පා මිලි කළ ඔකාවස් රජ පරපුරෙන් බට කැත් උසබනට අගමෙහෙසුන් වු ලක්දිව පොළො යොන පරපුරෙන් හිමි තුමා සරණ නිය රසින්..."[37]

ඒ අනුව සංස්කෘත ගද්‍ය කාව්‍යයන්හි මෙන් ම මෙකී සන්නස්හි ද අතිශයෝක්තිය පිරුණු ප්‍රශස්ති කාව්‍ය රචනා ශෛලියක් අන්තර්ගත ය.

33. පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ, මල්ලවආරච්චි, නිමල්, *සිංහල භාෂා විකාසනය හා ශිලා ලේඛන විමර්ශනය.* 62 පි.
34. මල්ලවආරච්චි, නිමල්, *සිංහල ගද්‍ය භාෂාවේ විකාශනය.* 71 පි.
35. අමරවංශ හිමි, කොත්මලේ, *ලක්දිව සෙල්ලිපි.* 341, පි.
36. Ranawella, G. S, **Inscription of Ceylon**. 149 P, රෝහණදීර, මැන්දිස්, *බද්දේගම ගිං ගගේ කිඹුල් මන්ත්‍රය සමග සුවිශේෂ ඓතිහාසික ලේඛන හතක්.* 59 පි.
37. Ranawella, G. S, **Inscription of Ceylon**. 150-155 P, අමරවංශ හිමි, කොත්මලේ, *ලක්දිව සෙල්ලිපි.* 341, පි. රෝහණදීර, මැන්දිස්, *බද්දේගම ගිං ගගේ කිඹුල් මන්ත්‍රය සමග සුවිශේෂ ඓතිහාසික ලේඛන හතක්.* 58 පි.

මෙම සන්නස් හි සංස්කෘත තත්සම වදන් විරල වුව ද යථෝක්ත සිංහල ගද්‍ය රචනා ශෛලිය සංස්කෘත රචනා ශෛලියට අනුගත වීමක් දක්නට ලැබේ. අනුරාධපුර යුගයේ සිංහල ගද්‍ය රචනා පෝෂණය වූයේ පාලි තත්භව වදන් සමූහයකින් ය. එ සේ ම වචන පිළිගැනීමේ දී හා එම වදන් ප්‍රත්‍යයවත් කිරීමේ දී සිදුවන අඩුපාඩු නිසා භාෂාවෙහි වියත් බව ගිලිහී ගිය අයුරු ද දක්නට ලැබේ. එහෙත් පොළොන්නරු යුගය වන විට සිංහල භාෂාව වඩාත් ඔපමට්ටම් වදන්වලින් හා පූර්ව ක්‍රියා මගින් එකට ගොනු කළ හැකි රචනා රීතියක් ගොඩනගා ගැනීමට සිංහල ලේඛකයන් උත්සුක වී ඇති ආකාරය සන්නස්වලින් පැහැදිලි වෙයි. දීර්ඝ වාක්‍යයකින් හා රිද්මයානුකූල පද යෝජනයකින් සිංහලයේ ගද්‍ය රචනා විලාසය හැඩ ගැසී ක්‍රමයෙන් ස්ථාවර ලක්ෂණ පෙන්නුම් කරන බව පොළොන්නරු යුගයේ සියලු ම සන්නස් තුළින් පැහැදිලි වෙයි.

## 8. භාෂා සෘණීකරණය

භාෂාමය සෘණීකරණය මධ්‍යතන යුගයේ ප්‍රධාන භාෂා ලක්ෂණයකි. භාෂා සෘණීකරණය යනු ප්‍රස්තුත භාෂාවකට වෙනත් භාෂාවකින් වචන ණයට ගැනීම යි. නොහොත් එක් භාෂා සම්ප්‍රදායක් කෙරෙහි වෙනත් භාෂා සම්ප්‍රදායක බලපෑමයි.[38] මෙය බාහිර භාෂා ගැටලුවකි. ප්‍රස්තුත භාෂා සමාජයක් කෙරෙහි දේශපාලන, සමාජ, සංස්කෘතික වශයෙන් වෙනත් භාෂක සමාජයක බලපෑම නිසා දේශපාලනික, සමාජීය, සංස්කෘතික වශයෙන් යම් යම් නව්‍ය ලක්ෂණ ඇතිවිය හැකි ය. ඒ අනුව සිංහල භාෂාවේ බොහෝ සෙයින් දැක ගත හැකි වන්නේ පාලි සංස්කෘත භාෂාවෙන් සෘණීකෘත පද ය.

පොළොන්නරු යුගයේ සන්නස් සාහිත්‍යය පුරා ම පාහේ දැකගත හැකි වන්නේ භාෂා සෘණීකරණ ලක්ෂණ ය. ඒ අනුව පනාකඩුව සන්නස, නිශ්ශංකමල්ල රජුගේ අල්ලයි සහ දොරටියාව සන්නස, චෝඩගංග රජුගේ බමුණාගල ආදී සන්නස්හි දක්නට ලැබෙන තත්සම හා තත්භව වදන් පහත පරිදි වෙයි.

---

38. කරුණාතිලක ඩබ්ලිව්. එ. ස්. *ඓතිහාසික වාග් විද්‍යා ප්‍රවේශය.* (කොළඹ 10: ගොඩගේ සහ සහෝදරයෝ, 2006) 74 පි.

| පාලි | සංස්කෘත | සිංහල | තත්සම/ තත්භව |
|---|---|---|---|
| චරිත්ත > | චාරිත්‍ර > | සිරිත් > | තත්භව |
| පඨවි > | පෘථිවි > | පොළො > | තත්භව |
| ඔක්කාක > | ඉක්ෂ්වාකු > | උකාවස්/ඔකාවස් > | තත්භව |
| පුබ්බ > | පූර්ව > | පෙර > | තත්භව |
| සංවච්චර > | සංවත්සර > | හවුරුදු/අවුරුදු > | තත්භව |
| දෝස > | දෝෂ > | දොස් > | තත්භව |
| රාජ > | රාජ > | රජ > | තත්භව |

මීට අමතර ව ක්ෂේත්‍ර > ඛෙත්ත > කෙත්, අග්‍ර > අග, උක්‍ෂු > උක් ආදී වශයෙන් ද තත්භව පද පොළොන්නරු සන්නස් පුරා ම පාහේ දැක ගත හැකි ය. ඒ අනුව පැහැදිලි වන්නේ පනාකඩුව, අල්ලයි, දොරටියාව, බමුණාගල ආදි සන්නස්හි තත්සම සම්ප්‍රදායට වඩා තත්භව සම්ප්‍රදාය ගරු කළ බව ය.

උක්ත තොරතුරුවලින් පිළිබිඹු වන පරිදි මාතෘ භාෂාගත වචනයන් තත්භව සම්ප්‍රදාය ඔස්සේ සිංහල ඌරුවට සකසාගෙන වචන භාවිතයට ගැනීම සන්නස්වලින් හෙළි වන්නා වූ තව ද එක් විශේෂත්වයකි.

## 9. සංස්කෘත හා පාලි භාෂාව සම්මිශ්‍රණයෙන් සිංහල වාක්‍ය සකස් කරගැනීම

පුරාතන සිංහල යුගයේ පාලි භාෂාව ප්‍රධාන වූ අතර මධ්‍යතන යුගයේ දී සංස්කෘත භාෂාවට ප්‍රමුඛස්ථානය හිමි විය. එම හේතු සාධකය පසුබිම් කරගනිමින් තත් සමයෙහි ලේඛන කලාවෙහි දක්නට ලැබෙන භාෂා විශේෂතාවක් ලෙස සංස්කෘත හා පාලි භාෂාව සම්මිශ්‍රණයෙන් සිංහල වාක්‍ය සකස් කර ගැනීම ද පෙන්වා දිය හැකි ය. මෙකී භාෂා පිළිබිඹුව පොළොන්නරු යුගයේ පනාකඩුව, බමුණාගල ආදී සන්නස් තුළින් පැහැදිලි වෙයි.

චක්‍රවර්ත්ති ස්වාමීන් වහන්සේ අභිෂේක මඬපයට....[39]

39. Ranawella, G. S, **Inscription of Ceylon**. 150 P, Fernando P. E. E, **The Sri Lanka Journal Of The Humanities**. 87 P.

ගල්වලින් බහා.... දුක් වුන් ප්‍රශාදයට මෙකුන් දරුමුණුබුරන් ච[40]

මෙම ලක්‍ෂණය ද භාෂා සෘණිකරණය නිසා සිදු වූ මධ්‍යතන යුගයේ භාෂා විශේෂතාවකි. ඒ අනුව සංස්කෘත හා පාලි භාෂාව සම්මිශ්‍රණයෙන් සිංහල වාක්‍ය සකස් කර ගත් අන්දම පොළොන්නරු යුගයේ සන්නස් තුළන් පැහැදිලි වෙයි.

## 10. ද්‍රවිඩ භාෂාවේ බලපෑම

ලාංකේය ඉතිහාසයෙහි අනුරාධපුර යුගයේ සිට බොහෝ ද්‍රවිඩ ආක්‍රමණයන් සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ ද්‍රවිඩ වචන සිංහල භාෂාවට එක් වූ අතර එය ද භාෂා පරිණාමයට බලපෑ තව ද එක් හේතුවකි. ඒ අනුව භාෂා සංස්පර්ශයෙහි ප්‍රතිඵලයක් ලෙස ද්‍රවිඩ භාෂාවෙහි ආභාසය සිංහල භාෂාවට ලැබුණු බවට පනාකඩුව තඹ සන්නස සාක්‍ෂ්‍යය දරයි.

*දෙමළ සිංහල*
කත්ති > කති[41]
ද්‍රවිඩ > දෙමෙළ[42]
බුදල් - *අල් ප්‍රත්‍ය* (බුද්ධ + අල්)

බුදල් යන වචනය පිළිබඳව විමසීමේ දී 'බුද්ධ යන්නට ද්‍රවිඩානුසාරයෙන් 'අල්' ප්‍රත්‍යයව බුදල් සිද්ධයි.'[43] යන්න කොත්මලේ අමරවංශ හිමි පෙන්වා දෙයි. මෙහි දී සිංහල වචන සෘණිකෘත වීම සඳහා පාලි, සංස්කෘත භාෂාවන්ට අමතරව ද්‍රවිඩ භාෂාව ද බලපා ඇති බව ප්‍රත්‍යක්‍ෂ ය.

තව ද මධ්‍යයතන යුගයේ දී සිදු වූ භාෂා පරිණාමීය ලක්‍ෂණයක් ලෙස සිංහල ප්‍රාකෘත යුගයන්හි පටන් ඇරඹී විරල ලෙස සිදු වූ ස්වර මධ්‍ය කේවල අස්ථාවර ව්‍යඤ්ජන ලෝපය හඳුන්වා දිය හැකි ය. ඒ සමඟ ම ලෝපාදේශාදී ස්වර සන්ධාන විධි ද ක්‍රියාත්මක වීමෙන් ධාතු ස දා,[44] පාද ස පා[45] ආදි රූප ද හුදෙක් ව්‍යඤ්ජන ලෝපය වූ

40. අමරවංශ හිමි, කොත්මලේ, *ලක්දිව සෙල්ලිපි.* 343, පි.
41. අමරවංශ හිමි, කොත්මලේ, *ලක්දිව සෙල්ලිපි.* 342, පි.
42. එම.
43. එම 347 පි.
44. Ranawella, G. S, **Inscription of Ceylon**. 155 P, රෝහණධීර මැන්දිස්, *බද්දේගම ගිං ගගේ කිඹුල් මන්ත්‍රය සමග සුවිශේෂ ඓතිහාසික ලේඛන හතක්.* 59 පි.
45. Ranawella, G. S, **Inscription of Ceylon**. 2 P.

තැන්හි පුත්‍ර ස පුත්,[46] චක්‍ර ස සක්,[47] ආදී රූප ද ලැබිණි. එ මෙන් ම ඉන්දීය වයඹ බටහිර භාෂාවල දක්නට ලැබෙන ඇතැම් රූපයන් ද සන්නස් තුළ දක්නට ලැබේ. මෙකී ලක්ෂණය පොළොන්නරු යුගයේ සන්නස් තුළ වාම > වම්, යවන > යොන ලෙස දක්නට ලැබීම විශේෂත්වයකි.[48] එ මෙන් ම ඉරානීය භාෂාවල දක්නට ලැබෙන න > ල වීමත් ල > න වීමත් යන ලක්ෂණය 'වන > වල' ලෙස පනාකඩුව තඹ සන්නසෙහි දක්නට ලැබේ.[49] තව ද භාෂා ලක්ෂණයක් ලෙස මධ්‍ය සිංහල යුගාරම්භයේ දී අස්වරිත වචනාන්ත ස්වරය ලොප් වීමෙන් ජනිත ඇතැම් වචනාන්ත ආගන්තුක අන්ත්‍ය ස්වාරගමය මඟින් හෝ අඝෝෂාදේශය මඟින් හෝ සුබෝච්චාරණයට පත් කර ගැනීම[50] සන්නස්හි දැක්වෙන 'කුර්වරා > කුම්බුර් > කුඹුරු, ක්ෂීර > කිර් > කිරි, ආඥා > ආණා > අණ, සර්වඥ > සබ්බඤ්ඤු > සවන්' යන පද තුළින් පැහැදිලි වෙයි. මෙලෙස පනාකඩුව, අල්ලයි, දොරටියාව සහා බමුණාගල ආදී සන්නස් හි දැක්වෙන මධ්‍යතන යුගයේ භාෂා ලක්ෂණ ලෙස ඇ ස්වරයෙහි ආගමනය, මෙතෙක් සිංහල ලේඛනයෙහි හමු නො වූ අනුස්වාරය පහළ වීම, වර්ගාන්ත අනුනාසික සංයුක්ත ව්‍යඤ්ජන කීපයක් හා සඤ්ඤක අක්ෂර පළමුවරට දක්නට ලැබීම, සරඅත් හලත් වෙසෙස පහළ වීම, මූලික ශබ්ද පද්ධතියෙන් 'ච' කාරය ඉවත් ව යාම, ද්විතීය දීර්ඝ ස්වරයේ පහළ වීම හා ලේඛනයෙහි ස්වරයන්ගේ හ්‍රස්ව දීර්ඝතා නිරූපණය, මිශ්‍ර සිංහලයෙහි ආරම්භය හා සංස්කෘත භාෂාවෙහි දැඩි බලපෑම... ආදිය හඳුන්වා දිය හැකි ය. තව ද මධ්‍යතන යුගයේ භාෂා පරිණාමීය ලක්ෂණ හඳුනා ගැනීමෙහි ලා මෙකී සන්නස් තුළින් මහත් සේවයක් ඉටු වන බව අවධාරණය කළ යුතු ය. එ මෙන් ම තවදුරටත් එම යුගයේ භාවිත කළ ඉතා අප්‍රකට සංඥා නාම රැසක් ද මෙකී සන්නස් තුළින් විද්‍යමාන වන අතර අක්ෂර රූප පරිණාමය පිළිබඳ විමසීමේ දී ද අන් මූලාශ්‍රයන්ගෙන් හෙළි නොවන්නා වූ බොහෝ දුර්ලභ භාෂා ලක්ෂණ පොළොන්නරු යුගයේ සන්නස් තුළින් විශද වන බව නිගමනය කළ හැකි ය.

---

46. Ibid 155 P.
47. Fernando P. E. E, **The Sri Lanka Journal Of The Humanities**. 87 P.
48. බලගල්ලේ, විමල් ජී, *සිංහල භාෂාධ්‍යයන ලිපි 1.* (කොළඹ 10: ගොඩගෙ සහ සහෝදරයෝ, 2004) 252 පි.
49. එම 253 පි.
50. බලගල්ලේ, විමල් ජී, *සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය.* (කොළඹ 10: ගොඩගේ සහ සහෝදරයෝ, 1992) 66 පි.

## ආශ්‍රේය ග්‍රන්ථය

අමරවංශ හිමි, කොත්මලේ, *ලක්දිව සෙල්ලිපි.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1969.

ආචාර්ය හරිශ්චන්ද්‍ර, විජයතුංග, *ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය.* කොළඹ 11: ගුණසේන සහ සහෝදරයෝ, 2017.

කරුණාතිලක ඩබ්ලිව්. එ. ස්. *ඓතිහාසික වාග් විද්‍යා ප්‍රවේශය.* කොළඹ 10: ගොඩගේ සහ සහෝදරයෝ, 2006.

කුමාරස්වාමි, ආනන්ද, *මධ්‍ය කාලීන සිංහල කලා.* සංස්කෘතික දෙපාර්තමේන්තුව, 1962.

කොඩ්රින්ටන් එස්. ඩබ්ලිව්, *ලංකාවේ පුරාතන ඉඩම් භුක්තිය හා ආදායම*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1980.

ගයිගර්, විල්හැම්, *සිංහල භාෂාවේ ව්‍යාකරණය.* ලංකාණ්ඩු මුද්‍රණාලය, 1938.

තිස්ස කුමාර, ආනන්ද, *සිංහල සන්නස් හා තුඩපත්.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2006.

පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ, මල්ලවආරච්චි, නිමල්, *සිංහල භාෂා විකාසනය හා ශිලා ලේඛන විමර්ශනය.* 62 පි.

බලගල්ලේ, විමල් ජී, *සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය.* කොළඹ 10: ගොඩගේ සහ සහෝදරයෝ, 1992.

මල්ලවආරච්චි නිමල්, පඤ්ඤාසාර හිමි ඔක්කම්පිටියේ, *සිංහල භාෂාව විකාශය සහ ශිලා ලේඛන විමර්ශන.* කැලණිය: මාධවී ප්‍රින්ටර්ස්, 2012.

මල්ලවආරච්චි, නිමල්, *සිංහල ගද්‍ය භාෂාවේ විකාශනය.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2005.

රෝහණදීර, මැන්දිස්, *ගිං ගඟේ කිඹුල් මන්ත්‍රය සමඟ සුවිශේෂ ඓතිහාසික ලේඛන හතක්,* [PGIAR] ප්‍රකාශනයකි: 2011.

Bell H. C. P, **Report on the kegalla district archaeological survey of Ceylon. (**Government printer ,1892) 91 P.

**Epigraphia Zeylanica,** Paranavitana Senarath. Ed. Vol IV, Amen House; oxford University press, 1934-1941.

**Epigraphia Zeylanica,** Paranavitana Senarath, Godakumbura. Ed. Vol V, E. C. Colombo Press, 1963.

Fernando, P, E, E, **Sri Lanka Journal of the Humanities**.1978, Vol IV.

**Journal of the Ceylon Branch of the Royal Asiatic Society**, (Colombo; The Colombo A pothecabies Company, Ltd Printers, Vol XXIX, No 77, part I, II, III, IV,1925.)

Ranawella, G, S, **Inscriptions of Ceylon**. Vol VI, Sri Lanka; Department of Archaeology, 2007.